**IPRC/16/170**

# මහනුවර යුගයේ සමාජ - සාමයික තොරතුරු හඳුනා ගැනීමෙහිලා කුසලානුක්‍රියා සන්දේශයෙහි' ප්‍රාමාණිකත්වය පිළිබඳ විමසුමක්

එම්. බී. බී. ජයසුන්දර[1*]

'කුසලානුක්‍රියා සන්දේශය' හෙවත් 'පුණ්‍යක්‍රියා සන්දේශය' යනු මහනුවර රජ පැමිණි කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (ක්‍රි. ව. 1747 - 1781) විසින් ස්වකීය පාලන සමයේ දී කරන ලද පුණ්‍ය කටයුතු විස්තර කරමින් රචිත ගද්‍ය ලේඛනයකි. සිය මුත්තණුවන්ට ගෞරව නාමයක් සහිතව කීර්ති ශ්‍රී රාජසිංහයන් විසින් තුම්පනේ ගම ප්‍රදානය කිරීමේ ප්‍රීතිය පළ කරනු වස් මේ කෘතිය රචනා කර ඇත්තේ විල්බාගෙදර මොහොට්ටාලගේ මුණුපුරෙකි. අන්තර්ගතය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී කුසලානුක්‍රියා සන්දේශය පින්පොතකි; රාජසිංහ ප්‍රශස්තියකි. කතුවරයාගේ අභිමතාර්ථය හා බැඳුණු එකී ලක්ෂණ අභිභවමින් මේ කෘතියෙන් ප්‍රතීත වනුයේ ශාසනික වංශකථාවක ලක්ෂණ ය. එසේ වුව ද මේ ගද්‍ය ලේඛනය මහනුවර යුගයේ ඉතිහාසය හදාරන්නවුන්ගේ ප්‍රාමාණික අවධානයට ලක්ව නැත. එබැවින් මහනුවර යුගයේ සෙසු සාහිත්‍ය මූලාශ්‍රයයන්හි දැක්වෙන ශාසනික තොරතුරු පිළිබඳව ද සාවධාන වෙමින් තත්කාලීන සමාජ - සාමයික තොරතුරු හඳුනා ගැනීමේ දී කුසලානුක්‍රියා සන්දේශය මූලාශ්‍රයයක් වශයෙන් භාවිත කිරීමේ හැකියාව පිළිබඳ විමසා බැලීම මේ පර්යේෂණයේ අරමුණ විය. එහි දී අනාවරණය වූ පරිදි ශ්‍යාමෝපසම්පදාව පිහිටුවීමෙහිලා අනුග්‍රහය දැක්වීම හැරුණු විට එක ම දිනෙක රෙදි වියා කරන ලද විශේෂ කඨින පූජාවක් හා අනුරාධපුරය, පොළොන්නරුව ඓතිහාසික නගරයන්හි දාගැබ් ප්‍රතිසංස්කරණය ආදී කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ශාසනෝපකාරී ක්‍රියාවන් රැසක් මෙහි වර්ණනාවට බඳුන් වේ. එසේ ම විල්බාගෙදර මොහොට්ටාල 'ශ්‍රී රාම රත්නායක රාජකරුණා සෙනෙවිරත්න පණ්ඩිත මුදලි' යන ගෞරව නාමයෙන් පිදුම් ලද බව ද මල්වතු විහාරයට 'ධම්මිකාරාමය' යැයි නම් තැබූ වග ද යනුවෙන් මෙහි ඇතුළත් තොරතුරු සමකාලීන වෙනත් කෘතියක නොඑන දුර්ලභ ගණයේ තොරතුරු ලෙස හඳුනා ගත හැකි විය. ඒ අනුව, පිංපොතක ස්වරූපයෙන් රචනා වූ රාජ ප්‍රශස්තියක් වන කුසලානුක්‍රියා සන්දේශය මහනුවර යුගයේ සමාජ - සාමයික තොරතුරු අධ්‍යයනයේ දී වැදගත් මූලාශ්‍රයක් බව තහවුරු වෙයි.

***ප්‍රමුඛ පදඃ** කුසලානුක්‍රියා සන්දේශය, කීර්ති ශ්‍රී රාජසිංහ, වංශකථා, පිංපොත, රාජ ප්‍රශස්ති*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *buddhisinh@gmail.com